## **විෂයය**

බුද්ධ ධර්මය

## **නිපුණතාව**

බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ක්‍රියා කරයි.

## **නිපුණතා මට්ටම**

මහා මංගල සූත්‍රය.

## **පාඩම**

22

මහා මංගල සූත්‍රය

**සැකසුම - පූජ්‍ය තාරපේරියේ ගුණරතන හිමි**

**8 ශ්‍රේණිය**

**බුද්ධ ධර්මය**

**22 පාඩම**

**මහා මංගල සූත්‍රය**

**1.බුදුරජාණන් වහන්සේ මංගල සූත්‍රය දේශනා කරන ලද්දේ**

1. බරණැස ඉසිපතනාරාමයේදී ය.
2. සැවැත්නුවර ජේතවනාරාමයේදී ය.
3. රජගහනුවර වේළුවනාරාමයයේදී ය.
4. තව්තිසා දෙව්ලොවදී ය.

**2.මහා මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු ගණන**

1. 18 කි. 2. 24 කි. 3. 28 කි. 4. 38 කි.

**3. මහා මංගල සූත්‍රය දේශනා කරන ලද්දේ**

1. සැරියුත් මහ රහතන් වහන්සේ ය.
2. ආනන්ද හිමිට ය.
3. එක්තරා දෙවියෙකුට ය.
4. සහම්පතී මහා බ්‍රහ්මයාට ය.

**4.පෙර දඹදිව වැසියන් කනට ඇසෙන දේ මංගල කරුණු වශයෙන් හඳුන්වන ලදී. එම පිරිස නම් කළේ.**

1. දිට්ඨ මංගලිකයන් ලෙසිනි.
2. සුත මංගලිකයන් ලෙසිනි.
3. මුත මංගලිකයන් ලෙසිනි.
4. මහා මංගලිකයන් ලෙසිනි.

5.සුදුසු ප්‍රදේශයක වාසය කිරීම මංගල කරුණකි.එය දැක්වෙන ගාථාවේ මුල් පදය වන්නේ

1. බහු දේවා මනුස්සාච යන්න ය.
2. අසේවනාච බාලානං යන්න ය.
3. පතිරූපදේස වාසෝච යන්න ය.
4. බාහු සච්චංච සිප්පංච යන්න ය.

6."මාතා පිතු උපට්ඨානං" යන්නෙහි අර්ථය වන්නේ.

1. දරුවන්ට සංග්‍රහ කිරීම ය.
2. පැවිදි උතුමන්ට උපස්ථාන කිරීම ය.
3. ධර්මයට අනුව හැසිරීම ය.
4. දෙමාපියන්ට උපස්ථාන කිරීම ය.

## පිළිතුරු

1. 2
2. 4
3. 3
4. 2
5. 3
6. 4